**PPSC Advertisement No : EX/EB/26/09**

## නැගෙනහිර පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ පුහුණුකරු තනතුර සඳහා වන පළමු සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයන් - 2026 (I)

නැගෙනහිර පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ පුහුණුකරුවන් සඳහා වන පළමු සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් නැගෙනහිර පළාත් සභාවේ www.ep.gov.lk වෙබ් අඩවියේ "Exams" යටතේ ඇති "Online Application" ඔස්සේ පමණක් ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් **2026.06.26** පෙ.ව. 9.00 සිට **2026.07.10** ප.ව. 10.00ට දක්වා ඉදිරිපත් කළ හැකිය.

**02. විභාගය පැවැත්වීම ඃ-**

මෙම විභාගයන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන අතර විභාගයන් පැවැත්වීම සඳහා ලේකම් විසින් පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසි වලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

**03. සුදුසුකම් ඃ-**

එක් නිලධාරියෙකුට කාර්යක්ෂමතා කඩඉම් විභාග එකකට වඩා පෙනී සිටිය නොහැක. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට නැගෙනහිර පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ පුහුණුකරු තනතුරෙහි,

III වන ශ්‍රේණියේ නිලධාරීන්ට පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ද,
II වන ශ්‍රේණියේ නිලධාරීන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට ද,

පෙනී සිටිය හැක.

**සැලකිය යුතුයි ඃ-** **ශ්‍රේණියට අදාල පත්වීම්/ උසස්වීම් ලිපියේ පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතු අතර, එසේ ලිපි පිටපත් අමුණා එවනු නොලබන අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. නියමිත ශ්‍රේණියට පත්වීමක්/ උසස්වීමක් නොලබා එම ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට ඉල්ලුම් කිරීම වරදක් ලෙස සලකනු ලබන අතර එවැනි අයදුම්පත් නිර්දේශ කිරීමෙන් වළකින ලෙසට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත අවධාරණය කරනු ලැබේ.**

**04. භාෂා මාධ්‍යය ඃ-**

මෙම විභාගයන් සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවකු ඉදිරිපත් වන විෂයයන් සියල්ල සඳහා එක් භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර, කිසිදු හේතුවක් නිසාවත් විභාගයන්ට ඉල්ලුම්කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**05. විභාග ගාස්තු ඃ-**

ප්‍රථම වරට මෙම විභාගයට අයදුම්කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන් පසු වාර වලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේනම් රුපියල් 700/- ක්ද එක් විෂයක් සඳහා පෙනී සිටින්නේනම් රුපියල් 600/- ක්ද ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊදිනට පෙර ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුව තුල නොගැලවෙන සේ අලවා එවිය යුතුය.(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.) එවැනි ලදුපත් අලවා නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසිම හේතුවක් මත ගෙවන ලද විභාග ගාස්තු ආපසු නොගෙවන අතර, ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩදෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර ගාස්තු භාරගනු නොලැබේ.**

## 06. විෂය නිර්දේශය ඃ-

### 6.1 III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

විභාගය පිළිබඳ විස්තර :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| (i) පුහුණු න්‍යාය, ශාරීරික යෝග්‍යතාවය සහ පුහුණු සැලසුම් | පැය 01 ½ | 100 | 40% |

විභාගය සඳහා විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| (i) පුහුණු න්‍යාය, ශාරීරික යෝග්‍යතාවය සහ පුහුණු සැලසුම් | පුහුණු න්‍යාය ශාරීරික යෝග්‍යතාවය සහ පුහුණු සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම |

### 6.2 II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

විභාගය පිළිබඳ විස්තර :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| (i) තෝරාගත් ක්‍රීඩාවක් පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම | පැය 01 | 100 | 40% |

විභාගය සඳහා විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| (i) තෝරාගත් ක්‍රීඩාවක් පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම | වාර්ෂික, මාසික, දෛනික පුහුණු සැලසුම් පිළියෙල කිරීම පිළිබඳ දැනුම |

## 07. අයදුම්පත ඃ-

7.1 මෙම විභාග දැන්වීම මාර්ගගත (online) අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර කියවා මෙහි සඳහන් උපදෙස් අයදුම්පත පිරවීමේ දී තරයේ පිළිපැදිය යුතු වේ. මාර්ගගත (online) විභාග අයදුම්පත **ඉංග්‍රීසි භාෂාවෙන්** සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත සහ ලියාපදිංචි තැපෑලෙන් එවන ලද මුද්‍රිත පිටපත යන දෙකම අප වෙත ලැබුණු පසු මෘදු පිටපතේ සහ මුද්‍රිත පිටපතේ සත්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. එසේ පරීක්ෂා කරන ලද අයදුම්පත වලංගු අයදුම්පතක් බවට නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද බව නැතහොත් ප්‍රතික්ෂේප කර තිබේද යන්න පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail) හෝ දැනුම් දෙනු ලැබේ.

7.2 අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. අපේක්ෂකයින් ඉදිරිපත් කරන යම් තොරතුරක් වැරදි බව අනාවරණය වන අවස්ථාවේ දී ඒ සඳහා අපේක්ෂකයින් සහ අයදුම්පත් සහතික කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා වගකිව යුතුය.

7.3 විභාගය පැවැත්වීමට ආසන්න දිනෙක අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර සම්බන්ධව නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඒ බව සඳහන් කරමින් නිවේදනයක් අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් සහ විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail) දැනුවත් කරනු ලැබේ.

**08. අයදුම් කරන ක්‍රමය ඃ-**

මාර්ගගතව යොමු කළ අයදුම්පත බාගත (Download) කර එහි මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා ලවා සහතික කර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, කන්නියා පාර, වරෝදය නගර්, ත්‍රිකුණාමලය** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාග කේත අංකය වන **EX/EB/26/09 සහ විභාගයේ නම** සඳහන් කර එවිය යුතුය.

**09. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම ඃ-**

විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයින් වෙත නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පෞද්ගලිකව විභාග ප්‍රතිඵල ලේඛනය එවනු ලැබේ.

**10. විභාග මධ්‍යස්ථාන ඃ-**

විභාගය පැවත්වීම සඳහා යෝජිත ප්‍රධාන නගර හා එහි අංකයන් පහත සඳහන් පරිදිය.

| <u>නගරය</u> | <u>නගර අංකය</u> |
|---|---|
| ත්‍රිකුණාමලය | 01 |
| මඩකලපුව | 02 |
| අම්පාර | 03 |
| කල්මුණේ | 04 |

**සටහන ඃ** යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.

**11. අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය -**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් සෑම අයදුම්කරුවෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛණයක් පිළිගනු ඇත.

i. ජාතික හැඳුනුම් පත.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
iii. වලංගු රියදුරු බලපත්‍රය.

අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය නොකර සහ විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳ නොමැති බව තහවුරු කර ගැනීම සඳහා මුහුණු දෙකන් නිරාවරණය වන සේ විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන්ට විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. එමෙන්ම විභාග ශාලාව තුළට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වනතුරු විභාග ශාලාධිපතිට හඳුනාගත හැකිවන පරිදි මුහුණු සහ දෙකන් ආවරණය නොකර සිටිය යුතුය.

**12.** මෙම දැන්වීමෙහි විධිවිධාන සලසා නොමැති යම්කිසි කරුණක් සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගන්නා තීරණය අවසාන තීරණය වේ.

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

2026.06.26